(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 58.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2023 සැප්තැම්බර් 20 බදාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

2693/2023

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය, අතුරු ආබාධ රහිත, බොහෝ රෝග සුව කිරීමට හැකියාවක් ඇති වෛද්‍ය ක්‍රමයක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රචලිත වී ඇති බවත්;

(ii) වෛද්‍ය ප්‍රතිකාරවල නියැලී සිටින දක්ෂ හෝමියෝපති වෛද්‍යවරුන්ට වර්ෂ ගණනාවක සිට ලියාපදිංචිය ලබා දී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) වර්ෂ ගණනාවක සිට ලියාපදිංචිය අපේක්ෂාවෙන් සිටින හෝමියෝපති වෛද්‍යවරුන්ට ලියාපදිංචිය ලබාදීම සඳහා සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

(ii) ප්‍රායෝගික පරීක්ෂණයක් තුළින් එම වෛද්‍යවරුන්ගේ දැනුම පරීක්ෂා කර ඔවුන්ට ලියාපදිංචිය ලබා දිය හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය දියුණු කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) හෝමියෝපති වෛද්‍ය ප්‍රතිකාර සඳහා අවශ්‍ය ඖෂධ ආනයනය කිරීමට විධිමත් වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

(iii) හෝමියෝපති විශ්වවිද්‍යාලය නැවත ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

2846/2023

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නව වාහනයක් පළමු ලියාපදිංචි කිරීම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයෙන් පමණක් සිදු කරන්නේද;

(ii) නොඑසේනම්, පළමු ලියාපදිංචි කිරීම සිදු කළ හැකි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වාර්ෂිකව හිමිකම් පැවරීම සිදු කරනු ලබන වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) වාහන හිමිකම් පැවරීමේ එක්දින සේවය සහ සාමාන්‍ය සේවය සඳහා අය කරන ගාස්තුව එක් එක් වාහන පංතිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

2934/2023

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභා වාර්තාව අනුව එම ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇති පොලිස් නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) චෝදනා එල්ල වී ඇති ඉහත එක් එක් පොලිස් නිලධාරියාගේ නම, පාස්කු ප්‍රහාරය සිදු කරනු ලබන අවස්ථාව වනවිට දැරූ තනතුර හා රාජකාරි ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම නිලධාරින් අතරින් මේ වනවිට සේවයේ නිරතව සිටින එක් එක් නිලධාරියාගේ නම හා සේවා ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම නිලධාරින් අතරින් සමහර නිලධාරින් ශ්‍රී ලංකා පොලිසියේ ඉහළ තනතුරුවල සේවය කිරීම හේතුවෙන් පාස්කු ප්‍රහාරය සම්බන්ධ පරීක්ෂණ අඩාල කිරීමට හෝ පරීක්ෂණ වාර්තා වෙනස් කිරීමට හැකියාවක් තිබෙන බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

2972/2023

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනාරක්ෂිත අයුරින් පාසල් සිසුන් මාර්ග ධාවන තරඟවලට සහභාගී කරවනු ලබන බව දන්නේද;

(ii) දැඩි රථවාහන තදබදයක් පවතින අවස්ථාවලදී ප්‍රධාන නගර ආශ්‍රිතව එවැනි මාර්ග ධාවන තරඟ පැවැත්වීමට පාසල් වෙත අවසර ලබා දී තිබේද;

(iii) එසේ නම්, එම අවසර ලබා ගනු ලබන පාසල්/ආයතන විසින් මාර්ග ධාවන තරඟවලට සහභාගී වන සිසුන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) ප්‍රධාන නගරවලින් ඈත්ව රථවාහන තදබදය අඩු මාර්ග පමණක් භාවිතා කර මාර්ග ධාවන තරඟ පැවැත්වීම සුදුසු බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් පාසල් වෙත නිකුත් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

3074/2023

ගරු අශෝක් අබේසිංහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ —

(i) සේවය කරනු ලබන මුළු සේවකයන් සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ස්ථිර සහ කොන්ත්‍රාත්/අනියම් පදනම මත සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කොන්ත්‍රාත්/අනියම් පදනම මත මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් ස්ථිර කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

3096/2023

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා තේ මණ්ඩලය සඳහා පළිබෝධ නාශක රසායනික සංඝටක විශ්ලේෂණ යන්ත්‍රයක් මිලදී ගන්නා ලද දිනය කවරේද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම යන්ත්‍රය මේ වනතෙක් භාවිතයට ගෙන නොමැති බව දන්නේද;

(iv) එසේ නම්, ඊට හේතු කවරේද;

(v) මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

3108/2023

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය, නෙඩුන්තීවු දූපතේ මේ වනවිට සිටින ගවයින් සංඛ්‍යාව කොපමණද;

(ii) නෙඩුන්තීවු දූපතෙහි පශු සම්පත් ගහනය එක් එක් සත්ව වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සතුන්ගේ ආහාර හා ජල අවශ්‍යතා සපුරාලනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නෙඩුන්තීවු දූපතෙහි සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයක් ස්ථාපිතකර තිබේද;

(ii) නෙඩුන්තීවු දූපත සඳහා ස්ථිර පශු වෛද්‍යවරයෙක් පත් කර තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) එම දූපත සඳහා ස්ථිර පශු වෛද්‍යවරයෙකු පත් කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8\.

3232/2023

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීගමුව-කුලියාපිටිය මාර්ගයේ, තුම්මෝදර නව පාලම ඉදිකිරීම සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදනය කොපමණද;

(ii) එම පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම ඉදිකිරීම් කටයුතු අවසන් කළ යුතු දිනය කවරේද;

(iv) එම පාලම ඉදිකරනු ලබන කොන්ත්‍රාත් සමාගම කවරේද;

(v) මේ වනවිට එම කොන්ත්‍රාත් සමාගමට ගෙවා ඇති මුදල කොපමණද;

(vi) තුම්මෝදර නව පාලමේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය,— 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2023 සැප්තැම්බර් 12 දිනැති අංක 2349/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2023.09.19 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය,— වන සංරක්ෂණ ආඥාපනත යටතේ නියෝග,— (451 අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 24(1) (ජ), (ට) සහ (ඩ) වගන්ති සමඟ කියවිය යුතු 64(2) (ඊ) වගන්තිය, 23අ, 23ආ, 23ඇ, 23ඈ සහ 28(3) වගන්ති සමඟ කියවිය යුතු 64(1) වගන්තිය, 24(1) වගන්තිය, 3අ වගන්තියේ (3), (4) සහ (5), 6 සහ 64 වගන්ති, 3(4) වගන්තිය සහ 64 වගන්තිය සහ 58 හා 59 වගන්ති සමඟ කියවිය යුතු 64 වගන්තිය යටතේ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරිය විසින් සාදන ලදුව 2023 අගෝස්තු 21 දිනැති අංක 2346/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.09.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පුරාවස්තු ආඥාපනත යටතේ නියෝග,— (188 වන අධිකාරය වූ) 1940 අංක 9 දරන පුරාවස්තු ආඥාපනතේ 46 වගන්තිය සමඟ කියවිය යුතු 47(1) වගන්තිය යටතේ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් 2023 මැයි 25 දින සාදනු ලදුව, 2023.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාර පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීමේ පනත් කෙටුම්පත— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

බෙදුම් නඩු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීම පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

සත්ව සුබසාධන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග (අංක 1),— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 10, 11, 13, 14, 16 සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 117 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 අගෝස්තු 09 දිනැති අංක 2292/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග (අංක 2),— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 10, 11, 26, 31(ඇ), (ඉ), (ඊ), (උ) සහ (ඌ) වගන්ති සමඟ කියවිය යුතු 117(2)(ට) වගන්තිය යටතේ වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 අප්‍රේල් 03 දිනැති අංක 2326/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.08.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— නීති අධ්‍යාපන සභා ආඥාපනත යටතේ රීති,— (276 අධිකාරය වූ) නීති අධ්‍යාපන සභා ආඥාපනතේ 7 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සංස්ථාගත නීති අධ්‍යාපන සභාව විසින් සාදන ලදුව, 2023 මැයි 15 දිනැති අංක 2332/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.07.18 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*18.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත යටතේ නියෝග,— 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනතේ 4(2) වගන්තිය සමඟ කියවිය යුතු 27 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජනවාරි 14 දිනැති අංක 2314/80 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.08.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියමය,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 29අ(2) වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 අප්‍රේල් 21 දිනැති අංක 2328/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.08.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45(1අ) වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2023 ජූලි 04 දිනැති අංක 2339/06 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.09.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*21.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා,— සමාගම් පනත යටතේ නියෝග,— 2007 අංක 07 දරන සමාගම් පනතේ 222 වගන්තිය සමඟ කියවිය යුතු 527 වගන්තිය යටතේ කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 මාර්තු 17 දිනැති අංක 2323/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා,— මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනත යටතේ නිවේදනය,— 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනතේ 4 (1)(ඊ) වගන්තිය යටතේ වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2022 අගෝස්තු 26 දිනැති අංක 2294/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.09.05 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙන යන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත යටතේ නියෝග,— 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙන යන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනතේ 3(5) වගන්තිය සමඟ කියවිය යුතු 10 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජූලි 07 දිනැති අංක 2287/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 24 දිනැති අංක 2324/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.25 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 සැප්තැම්බර් 09 දිනැති අංක 2296/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.06 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

26.

ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

27.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

28.

වයිට් රෝස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

29.

රොෂාන් රණසිංහ ජනසහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

මානව හිමිකම් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

32.

සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

33.

හදිසි මහජන සෞඛ්‍ය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

34.

නැගිටිමු නැගෙනහිර සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

35.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

36.

සමාධි සෞඛ්‍ය සේවා, පාරිසරික, කෘෂිකාර්මික, සංස්කෘතික හා ක්‍රීඩා මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

37.

දක්ෂිණ ලංකා තෘතීයික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

38.

සහන ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

39.

සමාධි භාවනා හා යෝගා මධ්‍යස්ථාන (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

40.

රුහුණු උදානය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

41.

“මාතර සමය” සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

42.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

43.

විවාහ (සාමාන්‍ය) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

44.
මුස්ලිම් විවාහ හා දික්කසාද (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

45.
දස්සනා බෞද්ධ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

46.
ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

47.
විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

48.
විවාහවීමේ අවම වයස පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

49.
වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

50.
පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

51.
පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

52.
ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

53.
ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

54.
ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

***** *සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***